

# කොඩියගෙ ළම

## ලක්ෂමන් කොඩිතුවක්කු

# ප්‍රසාදිකාගේ සිත් කවුළුව

ප්‍රසාදිකා අප හඳුනන්නේ සිඩ්නි නුවර වෙසෙන ප්‍රතිභාව පිරි ගායිකාවක් ලෙසිනි. ඇයගේ ගී අඩංගු සංයුක්ත තැටි යුගලක් එතෙර මෙතෙර සිංහල ගී රස විඳින ශ්‍රාවකයන්ට තිළිණ කොට ඇති ඇය නොබෝදා සිත් කවුළුව නම් කාව්‍ය සංග්‍රහය හරහා කිවිඳියක් ලෙසින් ප්‍රවාසී, විප්‍රවාසී සිංහල පාඨකයා අතරට පැමිණියාය.




කවිය යනු කුමක් ද? කවියා හෝ කිවිඳිය යනුවෙන් පිළිබිඹු වන්නේ කවුරුන් ද? ඇය අමතන්නේ කාව ද? ඇගේ කාව්‍ය බස හා ස්වරූපය කෙ-සේ නම් අර්ථකතනය කළ හැකි ද? ඇය මේ සියල්ලටම පාහේ සාධාරණයක් ඉෂ්ඨ කරමින් "කවිය යනු කුමක්ද" යන්න මැනවින් ග්‍රහණය කර ගනිමින් තම මුල්ම කවි නිර්මාණ කෘතිය අප අතට පත් කරන්නේ සාර්ථක කිවිඳියකගේ ලක්ෂණ විදහාපාමිනි. ඇය මනුෂ්‍යත්වයෙන් පිරි සංවේදී හදවතක් ඇති කිවිඳියක් බව මෙම නිර්මාණ රසවිඳීමේ දී මා හට පසක් වූ එක් කාරණාවක් විය. ඇය තම අත්දැකීම් මනා ලෙස හසුරුවමින් කාව්‍යරූපීව ප්‍රතිනිර්මා-ණය කරන්නේ බොහෝ අපූර්ත්වයෙන් යුක්තවය. තමා අවට සිදුවන දෑ නිරීක්ෂණය කරමින් එම අනුභූතීන් උපයෝගී කොට තම පරිකල්පනය තුළින් අවට ලෝකය දකින්නට උත්සාහ කර ඇති ඇයගේ නිර්මාණ බො-හෝ දුරට සාර්ථකය. ඇය දුක, සතුට, කඳුළ නැවුම් ආකාරයෙන් හා සරල ලෙසින් කවි බසට හරවා අනුන්ගේ සිතිවිලිවලට ප්‍රාණය පිඹින්නට සමත්කමක් දක්වන බව මෙම කවි රසවිඳි මට වැටහේ. එසේම ඇගේ බොහෝ කවිවල ගීතවත් බවක් ගැබ් වී ඇත්තේ කවියේ රසයට හානියක් නොවන පරිද්දෙනි.

ඉරි තැලුණු මහ පොළව - ගත දවන හිරු එළිය
කුසට අහරක් නැතිව - දෙතන නැත කිරි කඳුල

ඉරි තැලුණු මහ පොළව යන වදන්වැල් තුළ දුක් විඳින මවකගේ ශෝචනීයත්වය නිරූපිත කරන්නට වෑයම් කරමින් එම කවිය ආරම්භ කරන ඇය, එහි අභ්‍යන්තරය තුළින් දුක්ඛ්‍ය රසය මතු කරන්නට බස හසුරුවන්නේ බොහෝ සියුම්වය.

උකුල මත නුඹ හොවා -සොයා ගිය දිය කඳුල
මිරිඟුවක් වුණේ ඇයි - ළඟා වුණ හැම මොහොත

දරු සෙනෙහසින් දයාද්‍රිත වූ තම කුසෙන් උපන් දරුවාගේ කුසගින්න නිවන්නට උත්සහා දරණ මවක් ගැන කියාපාන මෙම කවිය තුළින් ඇය අපට කියාපාන්නට වෙර දරන්නේ සමාජ අසාධාරණත්වය ගැනයි. මිරිඟුවක්, දියකඳුළ වැනි සංකේත රූප භාවිතයට ගනිමින් ශෝක රසය පාඨකයාට කැන්දාගෙන එන්නට ඇය ප්‍රශ්සත වෙහෙ-සක යෙදෙයි.

වියරු වූ මාරයා පැහැරගති නුඹ හුස්ම
වසන්නට නුඹේ වත නැතේ මට සුදු සේල

අවසානයේ මරුවා ජයගෙන මවට දුක, කඳුළ උරුම කර දී සරල සුගම බස් වහරයකින් නිමා වන කවිය තුළින්, නිමා නොවන අනන්තයකට, කිවිඳිය පාඨකයාව රැගෙන යයි.

එසේම ප්‍රසාදිකාගේ නිර්මාණ ගොන්නට ඇතුළත් වූ තවත් නිර්මාණයක් වන්නේ විශ්වාසය නම් හයිකු සම්ප්‍රදායට අයත් කෙටි නිසදැස් පන්තියයි.

බිඳුණි - කැබලි එකතු කළෙමි
ලාටු ගා එකින් එක ඇලෙව්වෙමි
පෙර තිබූ පියකරු බව එහි නැත

බිඳුණු විශ්වාසය ඇය ප්‍රතිරූපනය කරන්නේ සැනෙකින් කැබලි වී යන බඳුනක් උපයෝගී කොට ගෙන ය. බඳුන ගැන වචනයක්-වත් සඳහන් නොකර බිඳුම ගැන පමණක් විශ්වාසය හා අවිශ්වාසය උපමා කරගනිමින් ගොඩනගා ඇති මේ නිමැවුම අපූරුය. ප්‍රේමය, ආදරය, විවාහය ආදී සියල්ලටම මැදිවන සැකය, අවිශ්වාසය මෙන්ම වරින් වර කඩ වූ විශ්වාසය මත පදනම්ව ගොඩ-නගා ඇති එම පදවැල් තුළින් ඇය මතු කරන්නනට උත්සහා දරන්නේ විශ්වාසය බිඳීමෙන් උපදින්නේ කිසිදු කළ එළියක් නොමැති සැකය, අවිශ්වාසය පමණක්ම බවයි. එය ලාටු ගා එකින් එක ඇලෙව්වෙමි යන පදවැල තුළින් වඩාත් ධ්වනිත වේ.

ඇගේ කැඩපත නම් කවි පන්තිය තුළින් නිරූපිත වන්නේ ජීවිතයේ අනිත්‍යයි.

පිරුණු රත් දෙකොපුල් - නාදළුවන් දෙතොල්
දිගු නයන නිලුපුල් - දසන් සමවේය මුතුවැල්

ඇය කවිය පටන්ගැන්මෙන් කියාපාන්නේ තාරුණ්‍යයේ චමත්කාරයයි.

පිරුණු ලැම රන්මල් - සිහිනිඟ පුළුලුකුල්
රස විඳි කැඩපත - තාරුණ්‍ය ය ඇය සුරතල්

නාඹර තාරුණ්‍යයේ රූප සොබාවෙන් මත් වී ඇති රුව අවසානයේ කැඩපත ආසන්නයේ දුක්වන ආකාරය ඇය මෙසේ කියාපායි.

ගිලුණු ලැම පරමල් - වැහැරුණී පුළුලුකුල්
දුක් වුණේ කැඩපත - වියෝවෙන් තාරුණ්‍යය
ඇගේ හිරිමල්

කැඩපත සමඟ අප ජීවිතයේ ක්ෂ්‍ය වීම බෙදාගන්නා ආකාරය පැරණි කවි බසෙහි කාව්‍ය රූප සැරසිලි තුළින් අලංකාර කරමින් ඇය ඉදිරිපත් කර ඇති අයුරු අපූරුය.

මමයි රූ මනමාලි කවි පන්තිය තුළින් ඇය පාඨකයාට කියන්නේ අහිමි වූ පෙමක් ගැන ය. ප්‍රේමයෙන් විකසිතවනවා සේම පරව යන අයුරුත්, ඒ නිසාම එම ප්‍රේමය ලොවට හොර රහසේ විත් රහසේම සැඟව යන අයුරුත් සංක්ෂිප්තව කවි බසට නැගීමට ඇය සමත් වී ඇත.

නන්නාඳුනනා කිරිල්ලියක් වී කවි පන්තියද ඇගේ කාව්‍යමය බසේ ප්‍රතිනිර්මාණිත අත්දැකීම්වල සාර්ථක ප්‍රතිඵලයක් ලෙස මම දකිමි. රාගය පමණක් මුල්කරගත්, ආදරය අහිමි වූ බිරිඳකගේ ශෝකාලාපය, අඳුර, සුළඟ, හිරු, සඳ, තරු,මල් වැනි සංකේත රූප භාවිතා කරමින් නිර්මාණය කරන්නට ඇය සමත්කමක් දක්වන්නීය.

නිල් නුබ ගැබ තුළ - දිදුලන තරු කැට සඳ
-තුරුලේ රැඳුණත්
පිසයන මදනල- විකසිත මල්වල- සුවඳ
සොයා ඇඳුණත්
රන් හසරැලි -කිරි සිනහ ගඟුල නිති-
හදවත පිරවුවත්
හිමි සඳ සෙනෙහස -අහිමි වුණේ ඇයි
-සෙවනත මත රැඳුනත්

මෙවැනි සාර්ථක නිර්මාණ බොහොමයක් අඩංගු වූ සිත් කවුළුව ඔබ අප සැමට සරලව, සෞම්‍යව රස විඳිය හැකි, ඇගේ නිර්මාණ දිවියේ එක් පැතිකඩක් විදහාපාන රසවත් කාව්‍ය සංග්‍රහයක් බව මගේ හැඟීමයි.